දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 4 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 13 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 25 දින ද සභාවට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.52,413,198 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ආදායම රු.227,776,384 ක් වූයෙන් රු.175,363,186 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | 2020 ගිණුම් සකස් කිරීමේදි නිවැරදිව මුද්දර ගාස්තු ගිණුම් තබන බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු බිල්කිරීම් රු.9,461,500 ක් වුවද සත්‍ය ආදායම රු.6,096,933 ක් විය. එහෙත් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු හිඟ බලපත්‍ර ආදායම දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | එකම ගොඩනැගිල්ලේ මහල් කිහිපයක් ඇති අවස්ථා වල දී එම ගොඩනැගිල්ල වෙන වෙනම තක්සේරු කර ව්‍යාපාර බදු ලේඛණයේ ඇති නමුත් පවත්වා ගෙවනු ලබන්නේ ව්‍යාපාරයකට පමණි. බදුකරු එකම අය බැවිනි. මෙවැනි දෝශ හඳුනා ගෙන නිවැරදි කිරීම් කර ඇත. |
| (iii) | සම්ප්‍රේෂණ කුළුණු ආදායම වරිපනම් බදු ආදායම යටතේ ගිණුම්ගත කර තිබුණි. | සම්ප්‍රේෂණ කුළුණු ආදායම වෙනම හඳුනා ගත යුතුවේ. | 2020 ගිණුම් සකස් කිරීමේදි සම්ප්‍රේෂණ කුළුණු ආදායම වෙනම ගිණුම්ගත කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | මූලා ප්‍රකාශන අනුව දේශිය ණය සහ සංවර්ධන අරමුදලේ (LLDF) ණයහිමියන් ලෙස රු.1,320,538 ක් දක්වා තිබුණද එම ණයහිමි ශේෂය පියවා ඇති බැවින් ජංගම බැරකම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | ගිණුම් වලින් මහහැරී ඇති දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණයහිමි ශේෂය 2020 ගිණුම් සකස් කිරීමේ දි නිවැරදි කරන බව දන්වමි. |
| (v) | 2014 සිට 2016 දක්වා වර්ෂයන්ට අදාළ රැඳවුම් මුදල් රු.2,147,098 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවිය යුතු රැඳවුම් මුදල් පොදු තැන්පත් යටතේ ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (vi) | අවමංගල්‍යා ශාලාවක් ඉදිකිරිම සඳහා රු.3,000,000 ක ප්‍රාග්ධන වියදමක් දක්වා තිබුණද අදාළ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ ඉටුකර නොතිබු අතර එම ප්‍රතිපාදනය සහා අනුමැතිය මත අත්තිඩිය සුසාන භූමියට යාබද සුසාන භූමියක් ඉදිකිරීම සඳහා මාරු කර තිබුණි. | මූලා ප්‍රකාශනවල අවශ්‍ය සංශෝධන සිදුකළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (vii) | මුද්දර ගාස්තු හා ණයහිමියන්ගේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂයන්, 2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂ ලෙස ලෙජරයට පිටපත් කිරීමේදී වෙනස්කම් සිදු වී තිබුණි. | පෙර වර්ෂයේ ශේෂ ප්‍රවර්තන වර්ෂයට සටහන් කිරීමේදී නිවැරදිව සටහන් කළ යුතුවේ. | මුද්දර ගාස්තු ශේෂය වැරදීමකින් ලෙජරයට පිටපත් කර නොතිබුණද 2019 ගිණුම් සකස් කිරීමේදි නිවැරදිව ආරම්භක ශේෂය පදනම් කර ගෙන ගිණුම් සකස් කර ඇත. |
| (viii) | 2018 අගෝස්තු 3 දින ස්ථාපිත කරන ලද රු.7,968,000 ක් වටිනා සූර්ය විදුලි උත්පාදන පද්ධතිය ස්ථාවර වත්කමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කමක් ලෙස ගිණුම් ගත කළ යුතුවේ. | සභාව සතුව ඇති ලිපිගොනු ඇසුරින් මෙම ලේඛණය සකස් කර ඇති අතර ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් විමසා ඉතිරි තොරතුරු ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

(ආ) <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මූලා ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන / වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූලා ප්‍රකාශනවල රු.13,850,065 ක් අඩුවෙන් හා රු.25,158,711 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 ගිණුම් සකස් කිරීමේ දි මෙම වෙනස සොයා ගළපන බව දන්වමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (i) | රු.27,253,988 ක් වූ ගිණුම් විෂයයන් 6 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | මුද්දර ගාස්තු ශේෂය වැරදීමකින් ලෙජරයට පිටපත් කර නොතිබුණද 2019 ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව ආරම්භක ශේෂය පදනම් කර ගෙන ගිණුම් සකස් කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී රු.101,280,234 ක වියදමක් දරා කොන්ත්‍රාත් පදනමට ඉදිකරන ලද එක් එක් කර්මාන්ත සඳහා දරන ලද වියදම හා මූල්‍ය/ භෞතික ප්‍රගතිය ආදි තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

1.4 **අනුකූල නොවීම.**

1.4.1 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | ------------------- | -------------------- | ------------- | ----------------------- |
| (අ) | මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 218 වගන්තිය | නගරාධිපතිවරයා විසින් සභාවේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක්ද ඇතුළත්ව සභාවේ පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 218 හා 286(අ) වගන්ති අනුව කටයුතු කළ යුතුවේ. | මෙම වාර්තාව බොහෝ දුරට නිම කර ඇති බැවින් ඉදිරි සභා වාරයක දී ඉදිරිපත් කළ හැක. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| (i) | XIX වැනි පරිච්ඡේදයේ 1 වන වගන්තිය | සභාව සතු නිල නිවාස උපලේඛනගත හා පොදු සේවා නිවාස යනුවෙන් වර්ග කර නොතිබුණි. | ආයතන සංග්‍රහය පරිදි කටයුතු කළ යුතුවේ. | ආයතන සංග්‍රහයේ නිල නිවාස සම්බන්ධ කොටස මාර්ගෝපදේශයක් ලෙස පමණක් අදාල කර ගනී. නිල නිවාස සම්බන්ධව සභා සම්මුතියක් මඟින් තීරණය කළ යුතු බැවින්, එවැනි තීරණයක් නොමැතිව නිල නිවාස වර්ගීකරණයක් සිදු කිරීමේ හැකියාවක් නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | VIII වැනි පරිච්ඡේදයේ 10.1(අ) වගන්තිය | නිලධාරීන් 7 දෙනෙකු පැය 08 ක කාලය ආවරණය කිරීමෙන් තොරව දින 94 ක් සඳහාද නිලධාරීන් 8 දෙනෙකු දිනක පැමිණීම හෝ පිටවීම යන දෙකෙන් එක් අවස්ථාවක් නොමැතිව දින 121 ක් සඳහා ද නිලධාරීන් 5 දෙනෙකු ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් පැමිණීම හා පිටවීම සටහන් නොකර දින 22 ක් සඳහා ද 1/20 දීමනාව ලබා ගෙන තිබුණි . | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. | මෙම නිලධාරීන්ගේ රාජකාරීන් අනුව පැය 08 කාලය සභාව තුලම රාජකාරියේ යෙදීමට සිදු නොවන අවස්ථා ඇත. එබැවින් ධාවන සටහන් අනුසාරයෙන් ද වැඩමුළු ආදියට සහභාගිවීම් සහ විශේෂ සාකච්ඡා පැවැත්වීම් ආදියේ දී ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කිරීමේ හැකියාවක් නොමැති බැවින් ඊට අදාළ චක්‍රලේඛ වලට අනුකූලව ගෙවීම් කර ඇත. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි
----------------------------------------------------------------

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හානි පාඩු ලේඛණයක් අද වන විට නඩත්තු කරනු ලැබේ. |
| (ii) | මුදල් රෙගුලාසි 177 හා 187(1) | ලැබෙන මුදල් දිනපතා හෝ හැකිතාක් අප්‍රමාදව බැංකුගත කළ යුතු වුවද සම්පූර්ණ මුදලම හෝ කොටසක් ප්‍රමාද වි දින කිහිපයකදි බැංකුගත කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එදිනෙදා ලැබෙන මුදල් එදිනම බැංකු ගත කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කරන ලෙස අදාල නිලධාරිනිය දැනුවත් කර ඇත. |
| (iii) | මුදල් රෙගුලාසි 188(2) | 2010 ජනවාරි සිට 2014 ජනවාරි 20 දක්වා කාල පරිච්ඡේදයට අදාළ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.48,681 ක් වටිනා චෙක්පත් 5 ක් හා මුදල් ඇණවුම් 2 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | මෙම චෙක්පත් 05 පිළිබඳව තොරතුරු ඉල්ලා බැංකුව වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. |
| (iv) | මුදල් රෙගුලාසි 371(2) හා (5) | 2000 සිට 2016 දක්වා කාලය තුල අවස්ථා 79 කදී ලබාගත් අත්තිකාරම් පියවා නොතිබු අතර දින 10 සිට 388 දක්වා කාලයක් ප්‍රමාද වී අත්තිකාරම් පිය වු අවස්ථා 58 ක් ද තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (v) | මුදල් රෙගුලාසි 486(ආ) සහ (2) | 2002 සිට 2019 දක්වා ලැබි තිබු රු.284,876 ක් වටිනා චෙක්පත් 20 ක් අගරු වි තිබුණද මෙම චෙක්පත් සඳහා | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුදල් ගෙවන ලෙස ලිපි මගින් දැනුවත් කර ඇති අතර මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි . |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (vi) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 2 ක ඉක්මවූ තැන්පතු රු.37,928,717 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාර්ෂිකව තැන්පත් ලේඛනයේ පවතින කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට කැටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3:1 ඡේදය | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහන පරික්ෂාව සිදුකර නොතිබුණි. | ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුවේ. | මේ සඳහා යෙදවීමට ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැත. අත්‍යවශ්‍ය අවස්ථා වල දී ඉන්ධන දැවීම පරීක්ෂා කරනු ලැබේ. වාහන පැරණි වන විට ඉන්ධන වැඩිපුර දැවීම නිසා වැඩිපුර ඉන්ධන නිකුත් කිරීමට සිදුවේ. ඉදිරියේ දී ඉඩකඩ ඇති පරිදි ඉන්ධන දැවීම පරීක්ෂා කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඉ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛය | අත්තිකාරම් නිකුත් කිරීමේදී එක් අවස්ථාවක ලබා දිය හැකි මුදල රු.100,000 ට නොවැඩි විය යුතු වුවද සභාව ඊට පටහැනි ලෙස 2019 ජනවාරි සිට අප්‍රේල් දක්වා වූ කාලසීමාවේදී රු.100,000 ඉක්මවා අත්තිකාරම් නිකුත් කළ අවස්ථා 05 ක් පැවතුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නගර සභාවේ සමහර අංශ වල කටයුතු පවත්වා ගෙන යාමේ දී (උදා; නාගරික ගරාජයේ හදිසි අළුත්වැඩියා කිරීම් ) මෙම අත්තිකාරම් 100,000 ඉක්මවා ගොස් ඇතත් අදාළ අත්තිකාරම් මුදල නිවැරදිව පියවීමට කටයුතු කර ඇත. |

1.4.2 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | මහා නගර සභා ආඥා පනතේ 188(1) වගන්තියේ විධිවිධානවලට පටහැනිව නාගරික මන්ත්‍රීවරුන් 15 දෙනෙකුට සියයට 04 ක පොළියකට වාරික 20 කින් අය කිරිමේ පදනම මත විදේශ සංචාරයක් සඳහා රු.1,500,000 ක් ලබා දී තිබුණි. | මහා නගර සභා ආඥා පනත අනුව කටයුතු කළ යුතුවේ. | මෙම මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රී වැටුපෙන් වාරික වශයෙන් අය කර ගෙන යනු ලබයි. |
| (ii) | මහා නගර සභා ආඥා පනතේ 185(2)(ඉ) හි විධිවිධානවලට පටහැනිව මිශ්‍ර ආදායම්, වරිපනම් හා සැලසුම් අංශවල මහජන සේවා | මහා නගර සභා ආඥා පනත අනුව කටයුතු කළ යුතුවේ. | නගර සභාවට ආදායමක් ලබාදීමට මෙම කාර්ය මණ්ඩලය අතිරේක වෙහෙසක් දරයි. එබැවින් මුදල් |

| | | |
|---|---|---|
| සැපයිමෙන් 2019 ජනවාරි සිට ජුනි දක්වා උපයන ලද ආදායමෙන් රු.1,181,197 ක් විධිමත් අනුමැතියකින් තොරව නිලධාරින් 27 දෙනෙකු අතර බෙදාගෙන තිබුණි. | | කාරක සභාව හරහා සභාවේ අනුමැතිය ඇතිව මෙම ගෙවීම් කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.284,365,691 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.299,585,345 ක් විය.

2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 2013 සිට පැවත එන සෘජු හර රු.24,232 ක් සහ සෘජු බැර රු.912,336 ක් හඳුනා ගෙන ගිණුම් වල ගැලපීම් කර නොතිබුණි. | සෘජු හර හා බැර හදුනාගෙන නිරවුල් කළ යුතුවේ. | සෘජු හර වශයෙන් පවතින රු.24,232 ක මුදල නිරවුල් කිරීමට බැංකුවට දැනුම් දී ඇත. ඒ අනුව ගිණුම් ගළපන බව දන්වමි. සෘජු බැර වශයෙන් පවතින රු.912,336 ක මුදල අද වන විට රු.14,837 ක් අඩු කර ගෙන ඇත. |
| (ආ) | සරප් අංශයට දිනපතා ලැබෙන මුළු මුදලම බැංකුගත නොකර කොටසක් බැංකුගත කිරීම මෙන්ම ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් හෝ අඩු මුදලක් බැංකුගත කර තිබූ අවස්ථා ද පැවතුණි. | දෛනිකව ලැබෙන සියළු මුදල් බැංකු ගත කළ යුතුවේ. | එදිනෙදා ලැබෙන මුදල් එදිනම බැංකු ගත කරන ලෙස අදාල නිලධාරිනිය දැනුවත් කර ඇත. |
| (ඇ) | සභාවේ අයවැය ඇස්තමේන්තුව ඉක්මවා අතිකාල හා නිවාඩු දින වැටුප් වශයෙන් රු.5,089,502 ක් ගෙවීම් කර තිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු සීමාව තුළ වියදම් දැරිය යුතුවේ. | වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම් කළත් මහජනයාහට සේවය සැලසීමේ දී කාණු සුද්ද පවිත්‍ර කිරීමේ දී ඩෙංගු මර්ධන ව්‍යාපෘති ආදියේ දී අදාල තත්වය අනුව අතිකාල වැඩිපුර පැවරීමට සිදු වී ඇත. එම ගෙවීම් වැය ශීර්ෂ මාරු කර නිවැරදිව ඉටු කර ඇත. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ. 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ. 31 දිනට මුළු හිඟය |
| | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 |
| වරිපනම් හා බදු | 429,000 | 396,850 | 364,849 | 396,690 | 424,300 | 400,112 | 375,515 | 368,936 |
| කුලී | 10,829 | 14,069 | 14,707 | 13,925 | 19,035 | 16,217 | 12,638 | 16,548 |
| බලපත්‍ර ගාස්තු | 22,650 | 23,159 | 15,608 | 91,084 | 23,500 | 45,731 | 16,895 | 86,815 |
| වෙනත් ආදායම් | 23,000 | 12,130 | 7,843 | 13,490 | 300,000 | - | 184,543 | 514,918 |
| | ---------- | ---------- | ---------- | ---------- | ---------- | ---------- | ---------- | ---------- |
| | 485,479 | 446,208 | 403,007 | 515,189 | 766,835 | 462,060 | 589,591 | 987,217 |
| | ====== | ====== | ====== | ====== | ====== | ====== | ====== | ====== |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2019 වර්ෂයේ අයවැයගත පුනරාවර්තන ආදායම රු.1,820,130,000 ක් ද සත්‍ය පුනරාවර්තන ආදායම රු.1,647,231,326 ක් වූයෙන් රු.172,898,674 ක් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

2.3.3 **වරිපනම් හා බදු**

(අ) **වරිපනම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම රු.389,722,862 ක් වුවද ඉන් රු.270,996,446 ක් හෙවත් සියයට 70 ක් පමණක් වර්ෂය තුල අයකර ගෙන තිබුණි. | බිල් කරන ලද වරිපනම් බදු ආදායම අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් ගෙවීම් කිරීමේ දී සමහර දේපළ හිමියන් වර්ෂය මුල දී ගෙවීම් කරනු ලබන අතර සමහර දේපළ සඳහා රතු නිවේදන නිකුත් කර අය කර ගැනීමට කටයුතු යොදා ඇත. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් රු.256,588,352 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් හිඟ දේපළ සඳහා රතු නිවේදන නිකුත් කර දේපළ තහනමට ගැනීමට කටයුතු කර ඇති අතර මෙම හිඟ දේපළ අතරට නගර සභාව සතු දේපළ ද ඇතුලත් වී ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුල දේපල 424 ක් සඳහා රතු නිවේදන නිකුත් කර රු.122,178,483 ක හිඟ වරිපනම් අයකර ගැනීමට අපේක්ෂා කළද රතු නිවේදන ලබා දී තිබූ වරිපනම් ඒකක 126 කින් කිසිදු මුදලක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | රතු නිවේදන නිකුත් කර ආදායම් පරීක්ෂකවරුන් විසින් වරිපනම් බදු අය කර ගැනීමට උපරිම උත්සාහ දරා ඇත. සමහර රතු නිවේදන ලැබූවන් දඩ මුදලුත් සමඟ ගෙවීම් කරන අවස්ථා ද ඇත. |

| | | | |
|---|---|---|---|
| (iv) | වරිපනම් බදු අය කරගැනීම සඳහා රතු නිවේදන ලබා දීමේදී හඳුනාගත නොහැකි දේපල 51 කින් අයවිය යුතු හිඟ මුදල රු.10,753,733 ක් විය. | දේපල හඳුනා ගෙන හිඟ මුදල් අයකර ගත යුතුවේ. | හඳුනා ගැනීමට නොහැකි වූ දේපල හඳුනා ගැනීම සඳහා තක්සේරු අංශය වෙත යොමු කර ඇත. |

(ආ) <u>කසළ බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| ව්‍යාපාරික ස්ථාන සමඟ ගිවිසුම්ගත වී නොමැති බැවින් හිඟ කසළ ගාස්තු සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ නොහැකි වී තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට හිඟ කසළ ආදායම රු.13,427,850 ක් විය. | හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගිවිසුම් ගත වීම සඳහා කෙටුම්පත් ගිවිසුමක් සකස් කිරීමට නීති නිලධාරි වෙත යොමු කර ඇති අතර ව්‍යාපාරික ස්ථාන සමඟ ගිවිසුම් ගත වීම සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සිදු කරමින් පවතී. |

(ඇ) <u>විනෝද බදු (සිනමාශාලා)</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| සිනමාශාලා 3 කින් විනෝද බදු අයකර නොතිබූ අතර පෙර වර්ෂවල සිට පැවත එන හිඟ රු.154,302 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | විනෝද බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල ආයතන වලට ලිපි මඟින් දැනුම් දී ඇතත් සිනමා ශාලා වලින් ලැබී ඇති ප්‍රතිචාර අසතුටුදායක වන අතර පත්මා සිනමා ශාලා වෙන් රු.9,000 මුදලක් ලැබී ඇත.<br><br>හිඟ ආදායම් එකතු කර ගැනීමට ආදායම් පරීක්ෂකවරු හරහා කටයුතු කරමින් පවතී. |

(ඇ) <u>වෙනත් බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| 2019 දෙසැම්බර් 31 දිනට හිඟ කේබල් ටී.වී. අදායම රු.4,718,601 ක්, විශේෂ ප්‍රචාරක දැන්වීම් හිඟ රු.10,490,318 ක් හා විශේෂ ප්‍රචාරක දැන්වීම් (වීථි නාම පුවරු) හිඟ රු.1,500,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ කේබල් ටී.වී ආදායම් අය කර ගැනීමට නොහැකි වී ඇත්තේ අදාල ආයතනය සහාව සමඟ පැවති ගිවිසුමෙන් ඉවත්වීම නිසා වන අතර එම ආයතනය සමඟ එකඟතාවයකට පත්වීමට කටයුතු කර ඇත. වීථි නාම පුවරු රු.1,500,000 ද අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

### 2.3.4 කුලී

#### (අ) කඩකුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 152 ක හිඟ කඩකුලී රු.8,682,115 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මාස 03 කට වඩා වැඩි හිඟ කුලියක් පැවති කඩ කාමරද පැවතුණි. | හිඟ කඩකුලී උපයා ගැනිමට කටයුතු කළ යුතුවේ. | මෙම හිඟ ආදායම් අය කර ගැනීම සඳහා තවදුරටත් ආදායම් පරීක්ෂක වරු හරහා කටයුතු කරමින් පවති. |
| (ii) | හිඟ ආදායම් වාර්තාව අනුව 2014 වර්ෂයේ සිට පැවති මස්කඩ හිඟ ශේෂය රු.2,471,517 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මස්කඩ හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මිශ්‍ර අදායම් අංශයේ ලෙජරයන් තුල මෙවැනි ඉදිරියට ගෙන ආ ශේෂයක් නොමැති බව ලෙජරයන් නිරීක්ෂණය කිරීමේ දී පෙනී යන ලදී. |

#### (ආ) දේපල කුලියට දීම (බදුකර)

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම් රු. 1,063,700 ක් වුවද ඉන් රු. 123,631 ක් පමණක් අයකර ගෙන තිබුණි. | බිල්කල ආදායම උපයා ගැනිමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර හිඟ ආදායම් ඇති කඩ කාමර සඳහා නීතිමය කටයුතු කරමින් පවතී. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට දේපල 14 ක හිඟ දේපළ කුලිය රු.5,410,402 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර හිඟ ආදායම් ඇති කඩ කාමර සඳහා නීතිමය කටයුතු කරමින් පවතී. |

### 2.3.5 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කිරීම් රු.13,698,500 ක් වුවද ඉන් වර්ෂය තුල අයකිරීම් රු. 5,630,461 ක් විය | බිල්කිරීම් වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපාර බදු නොගෙවා ඇති ව්‍යාපාර සඳහා ආදායම් පරීක්ෂක අංශය මඟින් නඩු මාර්ගයෙන් එම ආදායම අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත හා ව්‍යාපාර බදු ශේෂය රු.86,815,517 ක් වුවද ඉන් වර්ෂය තුලදී රු.3,762,091 ක් පමණක් අයකර ගෙන තිබුණි. | බදු අය කළ යුතු ස්ථාන නිසි පරිදි හඳුනා ගෙන අයකිරීම් කිරීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපාර බදු ආදායම ඇස්තමේන්තු කිරීමේ දී එකම ගොඩනැගිල්ලේ මහල් කිහිපයක් ඇති අවස්ථා වල දී එම ගොඩනැගිල්ල වෙන වෙනම තක්සේරු කළද පවත්වා ගෙන යනු ලබන්නේ එකම ව්‍යාපාරයකි. |

2.3.6 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

(අ) **උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| 2015 සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළව අධිකරණය මගින් අය කරගන්නා ලද උසාවි දඩ මුදල් රු.107,592,699 ක් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ මුදල් අය කර ගැනීමේ ක්‍රමවේදය අනුව බස්නාහිර පළාත් සභාවට ලැබිය යුතු ආදායම හා නගර සභාවට ලැබිය යුතු ආදායම වෙනම ද අය කර ගැනීමට කටයුතු කර ඇත. |

2.3.7 **අධිභාර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.3,563,042 ක් අයකර ගැනීමට තිබුණි. | අධිභාර ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳව කටයුතු කරමින් පවතී. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1. **කාර්ය සාධනය**

මහා නගර සභා ආඥා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබූ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | සංයුක්ත සැලැස්ම සකස් කළ වහාම ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ආ) <u>අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වනරතන පාරේ සිට ෆොන්සේකා පාර දක්වා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් 2018 පෙබරවාරි මස රු.4,500,000 ක් ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර තිබුණද 2019 වර්ෂය අවසන් වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබු අතර පවුල් 02 කට පමණක් ඍජු ප්‍රවේශයක් ලැබෙන මෙම මාර්ගය ඉදිකිරීම සඳහා දරන වියදම හා සාපේක්ෂව බැලීමේදි ලැබෙන ප්‍රතිලාභය අවම මට්ටමක පැවතුණි. | වඩාත් ඵලදායී කටයුතු සඳහා අරමුදල් යෙදවිය යුතුවේ. | මහා සභාවෙන් ගත් තීන්දු අනුව මෙම කටයුතු සිදු වී ඇත. |

(ඇ) <u>කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | රු.49,816,618 ක් වටිනා ව්‍යාපෘති 6 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි. | ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | ප්‍රේෂර් ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම හා දෙහිවල මහජන ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.50,000,000 ක් හා රු.60,000,000 ක් වශයෙන් එකතුව රු.110,000,000 ක වියදමක් 2018 මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් මෙම කර්මාන්ත දෙකෙහි ඉදිකිරීම් නිම කර නොතිබුණි. | ව්‍යාපෘති ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රේෂර් ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ වී නැති අතර, දෙහිවල මහජන ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ කටයුතු ඉටු කරමින් පවතී. |
| (iii) | 2018 වර්ෂයේ වීදි ලාම්පු සමීක්ෂණ කටයුතු සඳහා රු.1,500,000 ක වියදමක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් සමීක්ෂණ කටයුතු නිමකර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු කඩිනමින් නිම කළ යුතුවේ. | ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් සභාවේ අනුමැතිය නොලැබුණු බැවින්, සමීක්ෂණ කටයුතු ඉටු කිරීමට ආයතනයෙන් තෝරා ගැනීමට නොහැකි විය. |
| (iv) | 2018 වර්ෂයේදී Skid Steer Loader යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා රු.6,195,000 ක වියදමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් මිලදී ගැනීම සිදු කර නොතිබුණි. | මිලදී ගැනීම් කඩිනමින් සිදු කළ යුතුවේ. | නැවත යන්ත්‍රය ලබා ගැනීමට ටෙන්ඩරය 2020.07.16 දින විවෘත කරන ලද අතර, ඉදිරියේදි ඒ අනුව යන්ත්‍රය ලබා ගැනීමට විධිවිධාන යොදා ඇත. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු.23,102,250 ක් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය කළ යුතුවේ. | වෙන් නොකරන ලද කසළ තුළ මිශ්‍ර කසළ හා වෙන් නොකරන ලද කසළ යන වර්ග 02 ම ඇතුලත් වී ඇති නිසා එය විධිමත් අයුරින් සිදු වී නැත. නමුත් මේ වන විට විධිමත් අයුරින් සිදු කිරීමට කටයුතු කර ඇත |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | 2013 සහ 2014 වර්ෂවලට අදාලව ලැබිය යුතු සහික දීමනා රු.1,827,000 ක් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | සහික දීමනා කාලීනව ප්‍රතිපූර්ණය කර ගැනිමට කටයුතු කළ යුතුවේ. | 2015 වර්ෂයට පෙර වර්ෂයන්ට අදාළ ප්‍රතිපූර්ණය නොකළ ගෙවීම් කපා හැරීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ට ද පිටපතක් සහිතව බස්නාහිර පළාත් පාලන කොමසාරිස් වෙත ලිපි යොමු කරන ලදී. |
| (ආ) | 2013 සිට 2016 වර්ෂය දක්වා වැටුප් සඳහා ගෙවන ලද රු.124,425,530 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. | වාර්ෂිකව අදාල මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2015 ට පෙර ප්‍රතිපූර්ණය නොවූ වැටුප් ප්‍රතිපූර්ණ මුදල් චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබා කපාහැරීමත් ඉතිරි මුදල් අයකර ගැනීමටත් කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | රත්මලාන විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කසල ඉවත් කිරීම වෙනුවෙන් 2017 වසරේ සිට අයවිය යුතු රු.82,425 ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | 2019.03.28 දින මහා සභාවේ 07(x)59 තීරණය අනුව ඉදිරි කටයුතු සඳහා ගොනුව නීති නිලධාරිනිය වෙත යොමු කර ඇත. |
| (ඇ) | 2009 හා 2010 වර්ෂයන්ට අදාල හිඟ ජල බිල්පත වෙනුවෙන් රු.87,844 ක් සභාව විසින් ගෙවා තිබුණද අදාළ නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගන්නා ලෙස 2018 සැප්තැම්බර් 4 දිනැති ලිපියෙන් සභාව විසින් දක්වා තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | විනය පරික්ෂණය ප්‍රමාදයකින් තොරව අවසන් කර හිඟ බිල්පත් අයකර ගත යුතුවේ. | මොහුගේ විනය පරීක්ෂණය අවසන් වී නොමැති බැවින් මෙම මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇත. |
| (ඉ) | නිල නිවාස 4 ක ගිවිසුම්ගත කාලය ඉක්මවා තිබුණද පදිංචිකරුවන් ඉවත් කිරීම හෝ නව ගිවිසුම් අත්සන් කිරීමට හෝ කටයුතු නොකර තිබියදී තව දුරටත් එම නිල නිවාසවල පදිංචිකරුවන් රැඳී සිටිමින් තිබුණි. | ගිවිසුම්ගත කාලය ඉක්මවූ පසු පදිංචිකරුවන් ඉවත් කිරීම හෝ නව ගිවිසුම් අත්සන් කිරීමට හෝ කටයුතු කළ යුතුවේ. | සියලුම නිල නිවාස සඳහා ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට සහා අනුමැතිය ගෙන ඇති අතර , ගිවිසුම් සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | නිල නිවස සඳහා මිලදීගත් රු.52,920 ක් වටිනා ආරක්ෂිත කැමරා පද්ධතිය නිල නිවසේ නොතිබුණි. | නිල නිවාස ගිවිසුමේ 09 වැනි වගන්තිය අනුව කටයුතු කළ යුතුවේ. | හිටපු කොමසාරිස් නිල නිවසේ ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කර ඇති බවට ගබඩා ඉන්වෙන්ට්‍රියට ඇතුලත් කර නොමැති බවට දන්වා සිටින අතර ගබඩා ඉන්වෙන්ට්‍රිය ඇතුලත් භාණ්ඩ හා සවි කිරීම් නිවස භාර ගැනීමේදි අභ්‍යන්තර විගණන ඒකකයේ නිලධාරියෙක් සමඟ එම භාණ්ඩ පරීක්ෂාකර භාර ගන්නා බවද දන්වා සිටිමි. |
| (උ) | ආරක්ෂක සේවා ගිවිසුම අනුව පැය 12 ක සේවා මුරයෙන් පසු අනිවාර්යයෙන් සේවකයින් මාරු කළ යුතු වුවද ඊට පටහැනිව ඇතැම් සේවකයින් අඛණ්ඩව දින 20 ක් සේවයේ යොදවා තිබුණි. | ආරක්ෂක සේවා ගිවිසුම අනුව කටයුතු කළ යුතුවේ. | අඛණ්ඩව සේවයේ යොදවන සේවකයින් පිළිබඳ තොරතුරු වාර්තා කර නොමැති බැවින් අදාල ගාස්තු මාසික බිල්පතින් අඩු කිරීමට කටයුතු කර නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඌ) | 2019 වර්ෂයේදී මිලදී ගත් රු.2,192,050 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා භාණ්ඩ ලැබීමේ පත්‍රිකා (GRN) නිකුත් කර නොතිබුණි. | මිලදී ගැනිමේදි භාණ්ඩ ලැබීමේ පත්‍රිකා (GRN) නිකුත් කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

3.3 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

(අ) **<u>සේවක පුරප්පාඩු හා අතිරික්තතා</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------ |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 149 ක් හා අතිරික්ත 02 ක් පැවතුණ අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 07 ක පුරප්පාඩු පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳව වරින් වර පළාත් සභාවේ සාකච්ඡා පවත්වා ඇතත් පුරප්පාඩු පිරවීමට ඉහත බලධාරීත්වය මේ දක්වා අපෝහොසත් වී ඇත. |
| (ii) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව බඳවාගෙන ස්ථිර පත්වීම් ලබාදී තිබූ සේවකයන් 45 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කරගෙන නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කළ යුතුවේ. | මෙම සේවකයින්ට ගෙවන ලද වැටුප් පළාත් සභාව විසින් ප්‍රතිපූර්ණය කර ඇත. |
| (iii) | සභාවේ අවශ්‍යතා වෙනුවෙන් අනියම් පදනම මත 2019 වර්ෂයේදී සෞඛ්‍ය කම්කරුවන් 20 දෙනෙකු හා දෛනික පදනම මත සේවකයන් දෙදෙනෙකු බඳවාගෙන පිළිවෙලින් රු.7,118,061 ක් හා රු.574,726 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කළ යුතුවේ. | මෙම සේවකයින් ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා පමණක් යොදවා ඇති අතර, බල ප්‍රදේශයේ ඩෙංගු උවදුර මැඩලීම සඳහා මහත් පිටු වහලක් වී ඇත. ගරාජයේ වාහන විදුලි කාර්මික තනතුර හා බෙලෙක් වැඩකරු තනතුර සඳහා මෙම සේවකයින් දෙදෙනා අත්‍යාවශ්‍ය රාජකාරි සිදු කරන බැවින්, විධිමත්ව බඳවා ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (iv) | තනතුරු 07 ක් සඳහා නිලධාරීන් 11 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත ද පරිපාලන නිලධාරී තනතුර සඳහා එක් නිලධාරියකු අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවාද බඳවාගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදු නොකළ යුතුවේ. | එක් පරිපාලක නිලධාරීන්ගේ පූර්ණ කාලීනව සහා ලේකම් තනතුරේ රාජකාරි සඳහා වැඩ බැලීමට පත්කළ බැවින්, පරිපාලක නිලධාරියෙක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. |
| (v) | බස්නාහිර පලාත් පාලන අමාත්‍යාංශ ලේකම් (වැඩබලන) ගේ 2018 ජුනි 07 දිනැති ලිපිය අනුව තනතුරු 4 ක් සඳහා පමණක් මාස 12 ක උපරිමයකට යටත්ව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවිය හැකි වුවද ඊට පටහැනිව වෙනත් තනතුරු සඳහා විශ්‍රාමිකයන් 6 දෙනෙකු බඳවාගෙන තිබුණි. | විධිමත් අනුමැතියක් මත බඳවා ගැනීම් සිදුකළ යුතුවේ. | නව බඳවා ගැනීම් වලින් අනුයුක්ත කිරීම් සිදු නොවූ පරිසරයක සභාවේ කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට මෙම විශ්‍රාමිකයන් බඳවාගෙන තිබුණි. |
| (vi) | මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවයේ II(ආ) ශ්‍රේණියේ නිලධාරියකු MT 05 වැටුප් පරිමාණයේ සිට සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුර ලැබීමෙන් පසු ඔහුට හිමි විය යුතු වැටුප් පරිමාණය MN 06 විය යුතු වුවත් SL 01 වැටුප් පරිමාණය පළාත් රාජ්‍ය සේවා කොමිෂම විසින් ලබාදී තිබුණි. | නියමිත වැටුප් පරිමාණයේ තැබිය යුතුවේ. | මහජන සෞඛ්‍ය පරීක්ෂක වැටුප් පරිමාණය MT-05 වේ. පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාවෙන් SL-01 වැටුප් පරිමාණය ලබා දී ඇත. නමුත් 2013 කාර්ය මණ්ඩල සමාලෝචනයේදි වැටුප් විෂමතා නිරාකරණය කිරීමේදි MN-06 වැටුප් පරිමාණය ලබා දී ඇත. එම නිර්දේශය නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ දීද අදාල වේ. තවද මෙම සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියාගේ පත්වීම 2006.07.15 දිනට පෙරදාතම කිරීම පළාත් රාජ්‍ය සේවා කොමිසම් සභාව විසින් අනුමත කර ඇති බව දන්වමි. |

(ආ) <u>විනය කටයුතු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව කටයුතු නොකිරීම නිසා සභාවේ සේවය කළ සේවකයෙකුට 2013 සිට 2015 දක්වා වැටුප් වර්ධක ලබා දී වැටුප් සංශෝධනය කර හිඟ වැටුප් ලබාදීමට පියවරගෙන නොතිබූ අතර 2015 වර්ෂයේදී විධිමත් පරීක්ෂණයකින් තොරව වැඩ තහනම් කර 2016 දෙසැම්බර් 21 දින සිට අනිවාර්ය නිවාඩු යවා තිබුණි. 2018 අගෝස්තු 17 දින සිට නැවත සේවයේ පිහිටුවා තිබුණද 2019 දෙසැම්බර් 31 දින වන විටත් විනය කටයුතු අවසන් කර නොතිබුණි. | විනය පරීක්ෂණය කඩිනම් කර ඉදිරි කටයුතු කළ යුතු වේ. | මොහුගේ විනය පරීක්ෂණය පවත්වාගෙන යන අතර තුර විධිමත් විනය පරීක්ෂණ කමිටුවේ පැන නැගී ඇති ගැටළුවක් මත මෙම පරීක්ෂණය අවසන් කර නොමැති බව දන්වා සිටින අතර පරීක්ෂණය අවසන් වූ වහාම ඔහුගේ උසස්වීම හා අනිකුත් කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ඇ) **සේවක ණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (i) | සේවකයින් 592 දෙනෙකුගෙන් වර්ෂ 10 ඉක්මවූ රු.3,526,279 ක් වූ ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ණය කරුවන්ගේ වර්තමාන ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංක ලබා ගෙන නිත්‍යානුකූලව කටයුතු කර එම ණය මුදල් අයකර ගැනීමට උත්සාහ කරමින් පවතී. දැනට ඇප කරුවන් ලබා ගනිමින් මෙවැනි තත්වයක් ඉදිරියේදී ඇති නොවීමට පියවර ගෙන ඇත. |
| (ii) | 2019 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, ස්ථාන මාරු වී ගිය හා මිය ගිය නිලධාරින් 74 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.4,982,811 ක් ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම |

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) **බදු දේපල**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (i) | ඇතැම් දේපල සම්බන්ධයෙන් අයකරන බදු කුලිය වර්ෂ 5 කට වරක් සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | බදු කුලිය වර්ෂ 5 කට වරක් සංශෝධනය කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට කුලී වැඩි කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | සභාව සතු දේපල බදු දී තිබුණද ඇතැම් දේපල සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර ඇතැම් ගිවිසුම්වල ගිවිසුම්ගත කාලය ඉක්ම ගොස් තිබුණි. | දේපල සඳහා බදු ගිවිසුම් අත්සන් කළ යුතුවේ. | 2020 වර්ෂයේදි ගිවිසුම් ගත කිරීමට කටයුතු කර ඇත. |
| (iii) | බදු දී තිබූ ඇතැම් දේපල සභාවේ අවසරයකින් තොරව අතුරු බදු දී තිබුණි. | සභාවේ අවසරයකින් තොරව අතුරු බදු දීම නොකළ යුතුවේ. | අතුරු බදු දීමක් සිදු කර නොමැත. |
| (iv) | බදු ගිවිසුම් අත්සන් කර තිබූ ඇතැම් දේපල සම්බන්ධයෙන් ගිවිසුම්වල පැවති අඩුපාඩු හේතුවෙන් හිඟ කුලියක් පැවතියද නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි තත්ත්වයක් පැවතුණි. | බදු ගිවිසුම් කාලීනව සංශෝධනය කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් මෙම අඩුපාඩුකම් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |
| (v) | සභාව අවසර ලබා දි ඇති ආකාරයට ගිවිසුම්ගත ව්‍යාපාර පමණක් කළයුතු වුවද වර්තමානයේ වෙනත් ව්‍යාපාර කර ගෙන යන අවස්ථා පැවතුණි. | ගිවිසුම්ගත ව්‍යාපාර පමණක් කළ යුතුවේ. | නව ගිවිසුම් ගත වීමේදි මෙම දෝශය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත |

(ආ) **<u>වෙළඳ ස්ථාන කුලී</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------ |
| | සභාව සතු කඩකාමර 209 කින් 152 ක කුලී හිඟව පැවතුන අතර බොහෝ කඩ කාමර බදු දී තිබුණද බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එමෙන්ම සමහර ගිවිසුම්වල ගිවිසුම්ගත කාලය ඉක්ම ගොස් තිබුණද නැවත ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම් අත්සන් කළ යුතුවේ. | එම හිඟ කුලිය කොටස් වශයෙන් ගෙවීමට ඔවුන් එකඟ වී ඇති අතර එම හිඟ මුදල් ගෙවා අවසන් වූ පසු ගිවිසුම් ගත වන බව දන්වමි. |

3.5 **<u>වත්කම් කළමනාකරණය</u>**

3.5.1 **<u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම.</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------ |
| (අ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි දේපල 35 ක අයිතිය තහවුරු කිරීම පිළිබඳව අවශ්‍ය ඔප්පු හෝ පවරා ගැනීමේ නියෝග නොතිබුණි. | සභාව සතු දේපල වල අයිතිය තහවුරු කර ගත යුතු අතර ඒවායේ ප්‍රමාණය නිශ්චය කර හඳුනා ගත යුතුවේ. | මේ සම්බන්ධව අවශ්‍ය නීතිමය පියවර ගැනීමට හා ඉදිරියේ දී ආරක්ෂක පියවර ගැනීමටත් විධිවිධාන යොදා ඇත. |
| (ආ) | ඉඩම් පිළිබඳව වාර්ෂික සමීක්ෂණයක් දීර්ඝ කාලයක සිට සිදුකර නොතිබූ අතර සභාව සතු ඉඩම් වෙනත් පුද්ගලයන් විසින් අනවසරයෙන් අත්පත් කර ගත් අවස්ථා 5 ක් පැවතුණි. | සභාව සතු ඉඩම් පිළිබඳව වාර්ෂික සමීක්ෂණය කර වත්කම් ආරක්ෂා කර ගත යුතු වේ. | මේ සම්බන්ධව අවශ්‍ය නීතිමය පියවර ගැනීමට හා ඉදිරියේ දී ආරක්ෂක පියවර ගැනීමටත් විධිවිධාන යොදා ඇත. |
| (ඇ) | සභා දේපලක් වන දෙහිවල එදිරිවීර පාරේ වටබෝ වත්ත කෝන්ගහ වත්ත ඉඩම පර්චස් 4.94 ක් වූ අතර එහි අභාවිත ළිඳක් ඇති බව දක්වා තිබුණද එහි ළිඳක් නොතිබුණි. එම හිස් ඉඩම වටා ආරක්ෂිත වැටක් නොතිබූ අතර අවට ප්‍රදේශවාසීන් ගොඩනැගිලිවල ඉවත් කරන ද්‍රව්‍ය හා කුණු දැමීම සඳහා මෙම ඉඩම භාවිතා කර තිබුණි. | සභාව සතු දේපල සඳහා ආරක්ෂක විධිවිධාන යෙදවිය යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

3.5.2 **<u>වත්කම් වලින් ලැබිය යුතු ආදායම ලබා නොගැනීම.</u>**

| | | | |
|---|---|---|---|
| (අ) | රූඩ් 01 පර්චස් 4.19 ක් විශාල වූ ගල්කිස්ස වත්ත නැමති ඉඩම බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් භුක්ති විදිමින් පැවතුණි. | අනවසරයෙන් භුක්ති විදින පාර්ශවයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ගල්කිස්ස හෝටල් පාරේ අංක 4/89 දරන බිම් සැලැස්මේ රූඩ් 01 පර්චස් 4.10 ක් වූ ඉඩම | නව ගිවිසුමක් ඇතිකර ගැනීමට හෝ සංශෝධනය | වර්ෂ ගණනාවකට පෙර එළඹ ඇති ගිවිසුම 2020 දී කල් පිරීමට |

| | | | |
|---|---|---|---|
| | වාහන නැවතුම් පොලක් ලෙස භාවිතා කිරීම සඳහා ගල්කිස්ස හෝටලය වෙත බදු දී තිබුණු අතර මෙම දේපල බදුදීමේදී ගිවිසුම්වල පවත්නා අඩුපාඩු හේතුකොට ගෙන 2019 දෙසැම්බර් 31 දින වන විට මෙම දේපලේ හිඟකුලිය රු.4,319,761 ක් වී තිබුණ අතර එම කුලි මුදල් බදුකරුගෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | කර හිඟ කුළී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නියමිතය. ඉන්පසු තක්සේරුවක් සිදු කර නව ගිවිසුමකට එළඹීමට නියමිතය. ඒ පිළිබඳව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇත. |
| (ඇ) | බදු දේපල අතුරු බදු දීම නගර සභාවේ අවසරය නොමැතිව බදුකරුට සිදුකළ නොහැකි වුවද බදුගෙන ඇති දේපලක් වෙනත් කෙනෙකුට අතුරු බදු දී නාගරික මන්ත්‍රීවරයකු විසින් නගර සභාවට ගෙවන කුලියට වඩා වැඩි කුලියක් අය කර ගෙන තිබුණි. තවද නගර සභා ලේඛන අනුව 2019 දෙසැම්බර් 30 දිනට රු.435,340 ක හිඟයක් පැවතුණි. | නගර සභාවේ අවසරය නොමැතිව දේපල අතුරු බදු දීම සිදු නොකළ යුතුවේ. | එම අයකිරීම් සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

3.5.3 **<u>පවරා නොගත් වත්කම්</u>**

| | | |
|---|---|---|
| ෆ්‍රේසර් මාවතේ පිහිටි පර්චස් 19.10 ක් වූ ඉඩම අනවසරයෙන් භුක්ති විඳින අයගෙන් නැවත ලබා ගැනීම සඳහා 1999 අගෝස්තු 27 දින නඩු පවරා තිබුණි. | අනවසරයෙන් භුක්ති විඳින අයගෙන් දේපළ සන්තකය නැවත ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | පිළිතුර පිළිගත නොහැක. |

3.5.4 **<u>නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (අ) | වසා දමා හා මුද්‍රා තබා තිබූ කඩකාමර 19 ක් නැවත පවරා ගෙන ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට වාසබද්ධ අහෝසි කර මුද්‍රා තැබීමට කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | කසළ එකතු කරන වාහනයක් මාස 9 කට අධික කාලයක් ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. | ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | 2015 සහ 2018 වර්ෂවල දී රු.2,346,088 ක වියදමක් දරා බඩෝවිට 05 වන අදියර උත්සව ශාලාව ඉදිකර තිබුණ ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | උත්සව ශාලාව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

3.6 **<u>හඳුනා ගන්නා ලද පාඩු</u>**

| | | | |
|---|---|---|---|
| (අ) | ගබඩා නිලධාරී තනතුරට පත්කළ සෞඛ්‍ය කම්කරුවා විසින් 2017 නොවැම්බර් සිට 2018 අගෝස්තු දක්වා බඩු නිකුත් කිරීමේ නියෝග පත්‍රිකා වෙනස් කිරීම තුළින් | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ පිළිබඳව මූලික විමර්ශනයක් කර අයකර ගත යුතු මුදල අයකර ගැනීමට චූදිතයාට චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර අදාල මුදල් චූදිතයාගෙන් |

| | | | |
|---|---|---|---|
| | සභාවට සිදුවූ රු.131,475 ක පාඩුව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | අය කර ගැනීමට සියලු පියවර ගෙන ඇත. |
| (ආ) | 2011 නොවැම්බර් 11 දින සිට 2016 අප්‍රේල් දක්වා සේවය අත්හිට වූ සේවකයකු වෙනුවෙන් රු.1,413,903 ක වැටුප් හා දීමනා ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් ආපසු අයකර ගැනීමට නොහැකි වූ බැවින් ඒ සඳහා ගල්කිස්ස ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා තිබුණි. තවද ගෙවා තිබූ ශුද්ධ වැටුපට අමතරව වැන්දඹු හා අනත්දරු අරමුදලට රු.44,983 ක් සහ රක්ෂණ වාරික ලෙස රු.6,050 ක් ජාතික රක්ෂණ භාර ඒකකය වෙත ගෙවා තිබුණි. | වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | මේ දක්වා එම නඩු විභාග වෙමින් පවතී. |
| (ඇ) | 2019 නොවැම්බර් 18 දින සිදු කරන ලද රු.145,470 ක වරිපනම් බදු වංචාව සම්බන්ධයෙන් අලාභය අයකර ගැනීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල සේවක මහතාට විරුද්ධව ගල්කිස්ස පොලිසියේ පැමිණිලි කර විමර්ශනයක් පවතින අතර දෙපාර්තමේන්තු මට්ටමින් චෝදනා පත්‍ර නිකුත් කර විමර්ශනයක් ආරම්භ කර ඇත. |
| 3.7 | <u>දෘශ්‍ය අක්‍රමිකතා</u> | | |
| (අ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ලබාගත් කසළ කරදියාන කසළ අංගනය වෙත අනවසරයෙන් බැහැර කිරීම සම්බන්ධයෙන් කැරියර් බූම් රථයේ රියදුරුගේ සේවය අත්හිටුවා, 2019 මැයි 29 දිනැති මූලික විමර්ශන වාර්තාව අනුව සභාවට සිදුවූ මූල්‍යමය අලාභය ගණනය කර ඉදිරියේදි වැටුපෙන් අයකර ගැනීමේ පදනම මත 2019 ජුනි 17 දින නැවත සේවයේ පිහිටුවා තිබුණි. මෙම අනවසර කසල බැහැර කිරීම වෙනුවෙන් වූ පාඩුව රු.229,623 ක් ලෙස ගණනය කර තිබුණද සත්‍ය අලාභය මීට වඩා වැඩි බව අනාවරණය විය. | මූල්‍යමය අලාභය ගණනය කර අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සේවකයාගෙන් අය කිරිමට තිරණය කළ මුදල ප්‍රමාණවත් නොවන නිසා මුදල් කාරක සභාවේදී වැඩිදුරටත් සාකච්ඡා කිරිමට නියමිතය. |
| (ආ) | සෞඛ්‍ය පරිපාලකවරයකු විසින් නගර සභාවේ ට්‍රැක්ටර් රථ යොදාගෙන කෝට්ටේ නගර සභාවට අයත් ප්‍රදේශවල අපද්‍රව්‍ය ඇද විශාල වශයෙන් මුදල් ඉපයීම හා නොයෙකුත් අක්‍රමිකතා සිදුකර ඇති බවට වාර්තා වී තිබුණද මේ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් සිදුකර නොතිබුණි. | විමර්ශනයක් සිදුකර අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | විමර්ශනයක් සිදු කර ඇති අතර අය කර ගත යුතු මුදල සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවක් කර සෞඛ්‍යය පරිපාලකගෙන් අය කිරීමට කටයුතු යොදා ඇත. |

4. **<u>නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්</u>**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 14 ක් සඳහා 2020 මැයි 20 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අදාල කාලසීමාව තුල පිළිතුරු ඉදිරිපත් කළ යුතු වේ. | පිළිතුරු නොදුන් විමසුම් 09 ක් වන අතර ඉන් 05 ක කෙටුම්පත් සකසා යොමු කිරීමට කටයුතු කරමින් පවතී. ඉතිරි 04 ක පිළිතුරු සකස් කරමින් පවතී. |